**මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 19 උන විගණනයට ඉදිරිපත් කර තබුණු අතර ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1:3:1 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ණය හිමියන්ට ගෙවිය යුතු ශේෂ රු.4,125,067 ක් විය.

#### 1:3:2 අනුකූල නොවීම්

විගණනයේදී අනාවරණය වූ නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අංක 2.14.1 | සීල් තබන ලද මිල කැඳවීම් ලබානොගෙන වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.1,252,889 ක මුදලක් වැයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංගහයේ අංක 3.9.1 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව රු.1,320,000 ක වටිනාකමකට ප්‍රජා මධ්‍යස්ථාන 7 ක සිවිල් වැඩ ප්‍රදානය කර තිබුණි. |
| (ඇ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත | පාර්ශ්‍රමික වලින් රු.725 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි අංක 138 | වගකිව යුතු නිලධාරියකු සහතික කිරීමෙන් තොරව අතිකාල සඳහා රු.1,956 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි අංක 396 | මාස 6 කට වැඩි කාලයක් උපලබ්ධි නොවු රු.7,765 ක චෙක්පත් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය | අදාල අනුමැතින් ලබාගැනීමෙන් තොරව සහතික ප්‍රදාන උත්සවයක් සඳහා රු.7,430 ක මුදලක් පරිත්‍යාගයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,729,367 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,063,109 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2:2:1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු පරිදි ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| ආදායම් විෂයය | | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 739 | 808 | 16 | - | - | - |
| (ii) | බදු කුලී | 101 | 101 | - | 1,089 | 1,222 | 85 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 141 | 141 | - | 156 | 156 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,452 | 4,452 | - | 6,922 | 6,922 | 3 |

## 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** |
| <u>පුනරාවර්තන වියදම</u> | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 7,048 | 6,285 | 763 | 7,443 | 5,563 | 1,880 |
| වෙනත් | 535 | 309 | 226 | 610 | 1,405 | (795) |
| උප එකතුව | 7,583 | 6,594 | 989 | 8,053 | 6,968 | 1,085 |
| මූලධන වියදම | 1,367 | 881 | 486 | 992 | 2,040 | (1,048) |
| මුළු එකතුව | 8,950 | 7,475 | 1,475 | 9,045 | 9,008 | 37 |

**2:4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය**

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | අනුමත | තථ්‍ය |
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 09 | 08 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 17 | 15 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | - | 02 |
| | 27 | 26 |

**2:5 වත්කම් කළමනාකරණය**

**2:5:1 ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.3,087,560 ක් විය.

**2:5:2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

රු.700,000 ක් වටිනාකම වූ ඉඩම් හා ගොඩනැගිලි වර්ෂ 2 ට වැඩි කාලයක් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

**2:5.3 අචල ජංගම වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 6 කට වැඩි කාලයක සිට චලනය නොවී පැවති තොග (පාවිච්චි නොකළ) වටිනාකම රු.3,343 ක් විය.

**2:6 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය